**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇතිබව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්ව මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයන් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය අදායම, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි. භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ ආදලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අස්වැසුම ප්‍රතිලාභ සඳහා ගෙවිය යුතු බව තීරණය කර ගෙවීම සඳහා බැංකුගත කර තාක්ෂණික හේතු මත ආපසු හරවා එවා තිබූ එකතුව රු.78,115,000 ක මුදල වගකීමක් ලෙස ගිණුම්ගත නොකර කාලච්ඡේදයේ වියදමින් අඩුකර දක්වා තිබුණි. | අස්වැසුම ප්‍රතිලාභ ගෙවීමේදී SLIPS ක්‍රමයට ප්‍රතිලාභී දීමනා බැංකුගත වීම සිදු කෙරේ. එහිදී ගිණුම්වල පවතින දෝෂ නිසා ආපසු එවන මුදල් අධිභාර කර නැවත අක්මුදල් ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රතිලාභීන්ගේ හිඟ මුදල් ගෙවීමේ ක්‍රමයක් අනුගමනය කරනු ලැබේ. එබැවින් මෙම හිඟ ගෙවීම් බැදීමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කර නොමැත. තවද මෙම ගෙවීම් මුදල් පදනම මත සිදුකරන අතර මෙම මණ්ඩලය හරහා සිදුකරන ප්‍රධානතම කාර්යය සේ සළකා දැනුවත් කිරීමේ පියවරක් වශයෙන් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල එම වියදම් සටහනක් ලෙස සඳහන් කරන ලදී. ඉදිරියේදී මේ පිළිබඳව තවදුරටත් සවිස්තරාත්මක කරුණු දැක්වීමක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට සටහන් කරගත් බව කාරුණිකව දන්වමි. | ගිණුම් කාල පරිච්ඡේදයට අදාල වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියෙන් පවරාගනු ලැබූ සියළුම වත්කම් හඳුනාගැනීමකින් තොරව රු.16,607,288 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම වත්කම් වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදනය සිදුකර නොතිබුණි. | සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු වත්කම් 2023.06.30 දින මෙම මණ්ඩලය වෙත භාර දී තිබුණි. එහෙත් ඒවායේ මිලදීගත් කාලය හා වටිනාකම් හඳුනාගෙන නිසි පරිදි ක්ෂය කිරීම් සිදුකිරීමට අවශ්‍ය මිලදී ගැනීම් පිළිබඳ තොරතුරු සුබසාධක මණ්ඩලය වෙත ඉදිරිපත් නොකිරීම හා 2024 වර්ෂයේදී සියළුම වත්කම් නැවත අගය කර නිසි පරිදි ක්ෂය කිරීම් සිදුකරන බව කාරුණිකව පෙන්වා දෙමි. | වත්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවීම. |

## 1.6 නීති, රීති හා රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ 5.2 | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී එහි ඇතුළත් විය යුතු මූලික අංග වන කාල රාමුව, එක් එක් කාර්යයට අදාලව වගකිව යුතු පාර්ශවයන් හා අදාල කාර්යයන් හි අවසාන ප්‍රතිදානය වන කාර්යසාධන දර්ශක ඇතුළත් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ 2023 වර්ෂයේ විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු සම්පූර්ණ කර 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත. | රාජ්‍ය ව්‍යාපාර උපදෙස් පරිදි කටයුතු සිදුකළ යුතුවීම. |
| (ආ) | අංක 01/2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛයේ 04 ඡේදය | 1503 වැය විෂය යටතේ වෙන්වන ප්‍රතිපාදන වලින් වැටුප් හා වේතන අඩු කළ පසු ඉතිරි ප්‍රතිපාදනවලින් සහ 1509 වැය විෂය යටතේ වෙන්වන ප්‍රතිපාදන වලින් අවම වශයෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදනයන් ඉතිරි කර ගත යුතු වුවත් එසේ සිදුකර නොතිබූ අතර මුළු ඉතිරිවීමේ ප්‍රතිශතය සියයට (0.4) ක් විය. | අස්වැසුම ප්‍රතිලාභීන්ට ගෙවීම් SLIPS ක්‍රමයට ගෙවන බැවින් SLIPS Charges හා Server Solution සඳහා Cloud ඉඩ ලබා ගැනීමට විශාල මුදලක් 1509 වැය විෂය යටතේ දැරීමට සිදුවුවත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මෙයට බලපාන ලදී. එබැවින් 2024 වර්ෂයේ සිට මෙම වියදම් අස්වැසුම පරිපාලන වියදම් වලින් දැරීමට පියවර ගෙන ඇත. | අයවැය චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.20,751,771 ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.256,799 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,008,570 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික්ක 25 ක දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙනුවෙන් රු.33,983,216 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් රු.133,605,128 ක් ලෙස මුළු වටිනාකම රු.167,588,344 ක් අභියාචනා ක්‍රියාවලිය වෙනුවෙන් වැය දරා තිබුණද එම ක්‍රියාවලිය 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් ව නොතිබූ අතර කාර්යසාධනය සියයට 30 ක මට්ටමක පැවතුණි. | අභියාචනා හා විරෝධතා ක්‍රියාවලිය අවසන් කිරීමේ ප්‍රමාදය සඳහා එම මණ්ඩල වලට පත්කළ යුතු කාර්ය මණ්ඩලය පිළිබඳ පැනනැගුනු ගැටලු හා තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ ගැටලු ආදිය බලපාන ලදී. පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු වල ලබා ඇති දියුණුව නිසා මෙම වසරේ ප්‍රමාදයකින් තොරව කාර්යසාධන ප්‍රගතිය ලබා කරගත හැකි බව කාරුණිකව පෙන්වා දෙමි. | අභියාචනා ක්‍රියාවලිය කඩිනමින් නිම කළ යුතුවීම. |
| (ආ) | තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම හා අස්වැසුම වැඩසටහන සඳහා ප්‍රගතිය මැන බැලීමට අවශ්‍ය ප්‍රගති වාර්තාව කාලීනව සකස් කර නොතිබුණි. | මේ වන විට 2023 වර්ෂයේ ප්‍රගති වාර්තාව සකස් කර ඇති අතර එහි ඉංග්‍රීසි හා දෙමළ භාෂාවට පරිවර්තන කටයුතු සිදු කෙරෙමින් පවතී . | ප්‍රගති වාර්තාව කාලීනව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) | අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සංවර්ධනය කරන ලද ගුණාත්මක ඒකාබද්ධ සුබසාධන කළමනාකරණ පද්ධතියක් ලබාගැනීම උදෙසා ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් හතරක් ස්ථාපිත කර තිබුණ ද, පද්ධතියේ සංවර්ධන කටයුතු තවදුරටත් ක්‍රියාත්මකව පවතින බැවින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ගුණාත්මක සංවර්ධිත පද්ධතියක් ස්ථාපිත කර නොතිබූ අතර, ඒ අනුව අස්වැසුම වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමිවිය යුතු ප්‍රතිලාභීන් වෙත ප්‍රතිලාභ අහිමිවීමක් සිදුවී තිබුණි. | IWMS පද්ධතියේ පවත්නා සියලු අඩුපාඩු හා දුර්වලතා හඳුනාගෙන මේ වන විට එම අඩුපාඩු සම්පූර්ණ කිරීමට ගතහැකි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සඳහා ලෝක බැංකු ආධාර යටතේ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය (SPP) හරහා අවශ්‍ය සියලුම පහසුකම් හා සහාය මෙම මණ්ඩලයට ලබා දෙන බව සඳහන් කිරීමට කැමැත්තෙමි. | ගුණාත්මක තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය පද්ධතියක් ස්ථාපිත කිරීම කඩිනම්ව කළ යුතුවීම. |

## 3.2 මතභේදයට තුඩුදෙන කරුණු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අස්වැසුම ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2019 වසරේ දර්ශක පාදක කර ගනිමින් තෝරාගෙන තිබූ නමුත්, සමහර දර්ශක ඊට වෙනස්ව තිබූ බව නිරීක්ෂණය වූ අතර එම දර්ශක යොදා ගැනීමේ පදනම විගණනයට අනාවරණය නොවීය. | ප්‍රතිලාභීන් තෝරාගත් පදනම පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මුදල්,ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත පැහැදිලි කර ඇත. | අස්වැසුම ප්‍රතිලාභීන් තෝරා ගැනීමට සුදුසු නිර්නායක සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුවීම. |
| (ආ) | 2019 වසර සඳහා එක් පුද්ගලයෙකුගේ මාසික වියදම් වටිනාකම රු.6,999 ක් ලෙස යොදාගෙන තිබුණ ද ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදනය අනුව ආදායම් හා වියදම් පිළිබඳව ප්‍රමාණාත්මක මිනුම් අගයයන් දක්වා නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | තෝරාගත් නිර්නායක වල මිනුම් ගැසට් කර ප්‍රසිද්ධ කළ යුතුවීම. |
| (ඇ) | සුබසාධක ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා පදනම් වර්ෂය ලෙස 2019 වර්ෂය ගෙන තිබුණි. එසේ වුවද, ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා සෘජු බලපෑමක් සහිත උද්ධමන අනුපාතය 2019 වර්ෂයේදී සියයට 3.53 ක පහළ අගයක් පැවතිය ද 2020, 2021, 2022 හා 2023 වර්ෂ වලදී පිළිවෙලින් සියයට 6.15, 7.01, 49.72 හා 67.4 දක්වා ඉහළ ප්‍රතිශතයකින් වැඩිවී තිබුණි. ඒ අනුව කඩඉම් වටිනාකම තීරණය කිරීමට අදාල කාලානුරූපීභාවය හා වර්තමාන සංගතභාවය නොගැලපෙන බව නිරීක්ෂණය කෙරේ. | මෙම කරුණු හඳුනාගෙන ඇති අතර වර්ථමානයට ගැලපෙන පරිදි උද්ධමන අනුපාත සැලකිල්ලට ගෙන ගෘහස්ථ ආදායම් හා වියදම් අනුව ඉදිරියේදී කඩඉම් අගය තීරණය කිරීමට පියවර ගනු ලැබේ. | නිර්නායක සකස් කිරීම සඳහා කාලානුරූපීව වියදම් වර්ෂයක් තෝරා ගත යුතුවීම. |
| (ඈ) | ප්‍රතිලාභීන් තෝරාගැනීම හා දීමනා ගෙවීමට නියමකර තිබූ කාලරාමුව තුල නිමකිරීමට අදාලව විධිමත් අධීක්ෂණයක් මණ්ඩලය විසින් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවාගෙන නොතිබීම, තොරතුරු අනුමත කිරීම ප්‍රමාද වී තිබූ අතර ඒ නිසා කාර්යමණ්ඩලය බඳවා ගැනීම ප්‍රමාද වී තිබුණි. තාවකාලිකව රාජ්‍ය සේවයේ නිලධාරීන් අනුයුක්ත කරගෙන කාර්යයන් ක්‍රියාත්මක කලද ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සියළුම ක්ෂේත්‍ර | ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ගෙවීම් කිරීම නියමිත කාල රාමුව තුල සිදු කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| | නිලධාරීන් වෘත්තීය ක්‍රියාමාර්ග ගෙන මෙම විෂයට අදාල රාජකාරිවලින් ඉවත් වීමට අදාල කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමයි. අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක කිරීමත් සමඟ රටපුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට බාධාකරමින් මහජන උද්ඝෝෂණ ඇතිවීම නිසා එම කාර්යාලවල කටයුතු ප්‍රමාද වීම. ග්‍රාම නිලධාරීන් වැනි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහාය නොලැබීම නිසා ප්‍රාදේශීය ලේකම්වරුන් වරින් වර රාජකාරි තාවකාලිකව අත්හිටුවීම, ග්‍රාමීය මට්ටමින් තොරතුරු තහවුරු කර ගැනීම සඳහා නිලධාරියෙක් නොසිටීම හේතුවෙන් (වෘත්තීය ක්‍රියාමාර්ග මත රාජකාරිවලින් ඉවත්වීම නිසා) තේරීම් කමිටුවලට සහ අභියාචනා කමිටුවලට එම කටයුතු ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට අපහසු වීම. | |
| (ඉ) 2023 දෙසැම්බර් 31 දින විවිධ හේතු මත ප්‍රතිලාභීන් වෙත යොමු කරන ලද අස්වැසුම ප්‍රතිලාභ රු.78,115,000 ක් ආපසු හරවා එවා තිබුණු අතර අදාළ නිවැරදි කිරීම් සිදුකර 2023 දෙසැම්බර් 31 දින වන විට එම ප්‍රතිලාභ බෙදාහැර නොතිබුණි. මේ හේතුවෙන් සුබසාධක ප්‍රතිලාභ හිමිවිය යුතු එනම් සමාජ ආරක්ෂණය ලැබිය යුතු එම කණ්ඩායම් සඳහා ආර්ථික අර්බුදය පහවන තෙක් සහනයක් සලසා දීම සඳහා අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ලබාදීමේ වැඩසටහන පිහිටුවීමේ මූලික අරමුණ සාර්ථක වී නොතිබුණි. | අස්වැසුම වැඩසටහන යටතේ වෙන්කළ ප්‍රතිපාදන සුදුසුකම්ලාභී පවුල්වලට ගෙවීමට කටයුතු කර ඇත. නමුත් සුදුසුකම් ලැබූ සමහර ප්‍රතිලාභීන් ගිණුම් විවෘත නොකිරීම, ද්විත්ව හැඳුනුම්පත් පවතින ප්‍රතිලාභීන් සිටීම වැනි විවිධ කරුණු නිසා ප්‍රතිලාභී ගෙවීම් Hold කර ඇත. 2024 වර්ෂයේදී එම හිඟ ගෙවීම් කිරීමට පියවර ගෙන ඇත. | ප්‍රතිලාභ ලබාදීම කාලීනව ඉටු කළ යුතුවීම. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක් හෙවත් අනුමත තනතුරුවලින් සියයට 75 ක් ද ද්විතීය මට්ටමේ තනතුරු 15 ක් හෙවත් අනුමත තනතුරු වලින් සියයට 94 ක් ද ඇතුළුව මණ්ඩලයේ අනුමත මුළු තනතුරු 36 න් තනතුරු 28 ක් හෙවත් අනුමත මුළු තනතුරුවලින් සියයට 78 ක් පුරප්පාඩුව පැවතුණි. පුරප්පාඩු තනතුරු පිරවීමට හෝ කාර්ය මණ්ඩල සමාලෝචනය සිදුකර අනවශ්‍ය තනතුරු යටපත් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | මේ වන විට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පුරප්පාඩු වූ තනතුරු පිරවීමට හා අනවශ්‍ය තනතුරු යටපත් කිරීමට කටයුතු කර ඇත. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීමට හැකිවන ලෙස බඳවාගැනීමට හෝ අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුවීම. |